# ශ්‍රී ලංකාවේ වෙළඳ ශේෂය යහපත් කිරීම සඳහා මුදල් අව ප්‍රමාණය කිරීමේ ප්‍රතිපත්තියෙහි ඇති සඵලතාවය

ආර්. පී. අයි. ආර්. ප්‍රසන්න

**සංක්ෂිප්තය**

මෙම අධ්‍යයනයේ දී දිගුකාලීන වෙළඳ නම්‍යතාවයන් (trade elasticities) ව්‍යුත්පන්න කරගනිමින් සහ ජාත්‍යන්තර ආර්ථිකවිද්‍යා විෂයයේ සාකච්ඡා වන මාෂල්-ලර්නර් (Mashall – Lerner) කොන්දේසියෙහි තෘප්තභාවය පරීක්ෂාවට ලක්කරමින්, සාර්ව ආර්ථික ප්‍රතිපත්තියක් ලෙස වෙළඳ ශේෂය යහපත් කිරීම සඳහා භාවිතයට ගනු ලබන මුදල් අවප්‍රමාන කිරීමේ ප්‍රතිපත්තියෙහි ඇති සඵලතාව විමර්ශණය කරනු ලැබේ. එහිදී 1977 සිට 2006 දක්වා වාර්ෂික කාලශ්‍රේණි දත්ත (time series data) භාවිත කරමින් අපනයන සහ ආනයන ඉල්ලුම් ආදර්ශයන්ගේ අන්තර්ගත විචල්‍යයන්ගේ දිගුකාලීන සම්බන්ධතාව උපරිම භව්‍යතා සානුකලන පරික්ෂාව (Maximum - Likelyhood cointegration test) තුළින් නිරීක්ෂණය කරන ලදි. එසේම ADF සහ PP පරීක්ෂාවන්ගේ ප්‍රතිඵලයන්ට අනුව ආදර්ශයන්ගේ අන්තර්ගත සියළුම විචල්‍යයන් පළමු ගණයේ දී අනුකලිත වේ (integrated order I(I)). අධ්‍යයනයේ ප්‍රතිඵලයන්ට අනුව අපනයන හා ආනයන ඉල්ලුම් ආදර්ශයන්ගේ මිල නම්‍යතායවයන් අනම්‍ය වන අතර ඒවායේ නිරපේක්ෂිත අගයන්ගේ එකතුව එකට වඩා අඩු වේ. එමඟින් ශ්‍රී ලංකාවේ වෙළඳ ශේෂය යහපත් කිරීම පිණිස සපුරාලිය යුතු මාෂල් - ලර්නර් කොන්දේසිය ඉටු නොවන බව පැහැදිලි වේ. ඉහළ ආදායම් හා පහළ මිල නම්‍යතාවයන් ආනයන ඉල්ලුම් ආදර්ශයේ අන්තර්ගතවීම මගින් වෙළඳ ශේෂය යහපත් කිරීම උදෙසා මුදල් අවප්‍රමාණය කිරීමේ ප්‍රතිපත්තියෙහි සඵලතාව පහළ මට්ටමක පවතින බව මෙම අධ්‍යයනයෙන් නිගමනය කරන ලදි.